## පාරම්පරික දැනුම සුරැකීමේ අවශ්‍යතාවය

සංස්කෘතික විවිධත්වයේ අංගයක් වශයෙන් හා ජෛව හා ජෛවීය නොවන සම්පත් තිරසාරව භාවිතය සඳහා දැනුම පාරම්පරික දැනුම තුල ගැබ්ව ඇත. එසේම පාරම්පරික දැනුම අප ජාතිය සතු අනගි වස්තුවක් සේ ම සංස්කෘතික අනන්‍යතාවක්ද වන්නේය.

පවතින සමාජ ආර්ථික ප්‍රවණතා සහ නවීන තාක්ෂණයේ ප්‍රචලිතවීම හමුවේ පාරම්පරික දැනුම ක්‍රමයෙන් සමාජයෙන් තුරන්වීමේ අවදානමක් උද්ගතව ඇත.

### පාරම්පරික දැනුම සංරක්ෂණය

පාරම්පරික දැනුම පෝෂණය කරන එය පරම්පරාවෙන් පරම්පරාවට රැගෙන යන සමාජයේ භාෂා හා සංස්කෘතීන් වර්ධනය කිරීම ශ්‍රී ලංකා රජයේ වගකීමක් බව ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 27 වන වගන්තියේ (රාජ්‍ය ප්‍රතිපත්ති මෙහෙයුම් මූලධර්ම) 10 වන උප වගන්තියෙන් පෙන්වා දී ඇත.

ශ්‍රී ලංකාව පාර්ශවකාර රාජ්‍යයන් වූ ජෛව විවිධත්ව සම්මුතියේ 8 (j) වගන්තියෙන් පාරම්පරික ජනතාවගේ ජීවන රටාව පෝෂණය කිරීමත් පාරම්පරික දැනුම සංරක්ෂණය කර භාවිතා කිරීමටත් එම රාජ්‍යයන් බැඳී සිටිය යුතු බව සඳහන් වේ.

### පාරම්පරික දැනුම හා ව්‍යවහාරයන් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය

පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය මගින් සකස්කල මෙම ජාතික ප්‍රතිපත්තිය මගින් පාරම්පරික දැනුම සංරක්ෂණයටත් එය තිරසාර සංවර්ධනය සඳහා යොදාගැනීමටත් අවශ්‍ය නෛතික ප්‍රතිපාදන සපයයි.

## ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මකවන පාරම්පරික දැනුම සංරක්ෂණය කිරීමේ වැඩසටහන්

☆ පාරම්පරික දැනුම රැස්කිරීම හා ලේඛනගත කිරීම.

☆ පාරම්පරික දැනුම සංරක්ෂණයට අදාලව භාෂා විද්‍යාගාර පිහිටුවීම.

☆ පාරම්පරික දැනුම හා සම්බන්ධ ක්ෂේත්‍රයන්හි ප්‍රදර්ශන හා සම්මන්ත්‍රණ, වැඩමුළු ආදිය පැවැත්වීම.

☆ ජගත් ආදිවාසී දිනය (අගෝස්තු 09) සමරමින් පාරම්පරික දැනුමට අදාල වැඩසටහන් පැවැත්වීම.

☆ මෙයට අමතරව විශ්ව විද්‍යාල හා වෙනත් රාජ්‍ය ආයතන මගින් පාරම්පරික දැනුම සංරක්ෂණයට හා භාවිතය ප්‍රචලිත කිරීමට කටයුතු කරයි.

☆ මීට අමතරව රාජ්‍ය නොවන සංවිධාන රාශියක් ද පාරම්පරික දැනුම සංරක්ෂණයට අදාලව දිවයිනේ විවිධ ප්‍රදේශවල ක්‍රියාත්මක වෙමින් පවතී.

**දේශයේ උරුමය**
**"පාරම්පරික දැනුම"**
**ජීවයේ තිරසාර පැවැත්ම උදෙසා යොදා ගනිමු.**


**වැඩි විස්තර සඳහා අමතන්න**

BDS
BIODIVERSITY
SECRETARIAT

අධ්‍යක්ෂ,
ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය
අංක 104, "පරිසර පියස" රොබට් ගුණවර්ධන මාවත,
බත්තරමුල්ල.
දුරකථන/ෆැක්ස් 011 2887454



සැකසුම
ටී.එම්.අනුරුද්ධ තෙන්නකෝන්
ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය.




# දේශයේ උරුමය "පාරම්පරික දැනුම" ජීවයේ තිරසාර පැවැත්ම උදෙසා යොදාගනිමු

2007 ජුලි 07 -13
ජාතික පුරාවිද්‍යා සතිය වෙනුවෙන්
ප්‍රකාශයට පත්කරන ලදී.




ජෛව විවිධත්ව ලේකම් කාර්යාලය
පරිසර හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය

## පාරම්පරික දැනුම

අප රට සතු දිගු ඉතිහාසයත් අභිමානවත් සංස්කෘතියත් බුදු දහමෙන් පෝෂණයවූ සමාජ පරිසරයත් හේතුවෙන් අප ලොව විස්මිත දෑ කළාවූ ජාතියක් බවට පත්වී ඇත. මහින්දාගමනයත් සමග විවිධාකාර ක්ෂේත්‍රයන්හි විකාශනය ඇරඹුණු අතර දේශීය අනන්‍යතාවක් සහිතව අපටම ආවේණික උරුවකින් ලොවම මවිතකල නිර්මාණයන් අප මුතුන්මිත්තන් බිහිකලේය. මේ සියල්ල සඳහාම යොදාගත් මාහැඟි සම්පත වන්නේ අදාල ක්ෂේත්‍රයන්හි පැවති දැනුම් සම්භාරයයි. බටහිර තාක්ෂණය නුපන් යුගයක විස්මිත දෑ තනන්නට දායකවූ මෙම දැනුම අප සතු පාරම්පරික දැනුමයි.

### පාරම්පරික දැනුම යනු.

යම් නිශ්චිත භූගෝලීය සීමාවන් තුල හෝ ප්‍රදේශයක ජීවත්වන ජනතාව දරා සිටින දැනුම් සම්භාරය එකී භූගෝලීය සීමාවන් වලින් දැක්වෙන ප්‍රදේශයට / ජනතාවට අයත් පාරම්පරික දැනුම වේ.

පාරම්පරික දැනුම දේශීය දැනුම හෝ දේශීය ඥානය වශයෙන්ද හඳුන්වයි.

පාරම්පරික දැනුම පරම්පරා ඔස්සේ සම්ප්‍රේෂණය වන බැවින් මෙම දැනුම හැඳින්වීම සඳහා වඩාත්ම උචිත වදන වන්නේ පාරම්පරික දැනුම යන්නයි.

### පාරම්පරික දැනුමෙහි ප්‍රධාන ලක්ෂණ

- ☆ අනාදිමත් කාලයක සිට පරිසරය භාවිතයෙන් ලද අත්දැකීම් මත ගොඩනැගුණු දැනුමකි.
- ☆ පරම්පරාවෙන් පරම්පරාවට උරුමවන දැනුමකි.
- ☆ මුඛ පරම්පරාවෙන් (කට වහරින්) පරම්පරාවෙන් පරම්පරාවට ගමන් කරයි.
- ☆ මෙම දැනුම ලේඛන ගතවී නොමැති අතර ව්‍යවහාරයේ පවතී.
- ☆ පවතින සංස්කෘතියට සහ ප්‍රදේශයට ආවේණිකතාවක් සහිතය.

## ශ්‍රී ලංකාවේ පාරම්පරික දැනුම සුලභව යොදාගෙන ඇති ක්ෂේත්‍ර

### කෘෂිකර්මාන්තය

ප්‍රධාන වශයෙන් මඩ වී වගාවේදී සහ ගොඩ වී වගාවේදීත් කඳුකර කලාපයේ "හෙල්මළු" ගොවිතැනේදීත් හේන් වගාවේදීත් ගෙවතු වගාවේදීත් බිම් සැකසීමේ පටන් අස්වැන්න කල්තබා ගැනීම දක්වා ම සුවිශේෂීවූ පාරම්පරික දැනුම් සමුදායක් යොදාගනී.

මෙහිදී වගාවට සරු භූමි හා උචිත කාලයන් සොයාගැනීම, කෘමීන් සහ පළිබෝධ පාලනය, පොහොර යෙදීම, අස්වනු කල්තබා ගැනීම ආදියට අයත් පාරම්පරික දැනුම් විස්මය දනවන සුලුය.

### සත්ත්ව පාලනය

සත්ත්ව පාලනයේදි රෝග පාලනය සහ ප්‍රතිකාර ක්‍රම සඳහා යොදාගැනෙන පාරම්පරික දැනුම අතර කෙම් ක්‍රම, හංවඩු ගැසීමේ ක්‍රම ආදිය ඉතාමත් සුලභය.

### පාරම්පරික වෛද්‍ය ක්‍රමය

පාරම්පරික දැනුම් සමුදායක් කැටිව පවතින ප්‍රධානතම ක්ෂේත්‍රය ලෙස හැඳින්විය හැකි අතර ඔසු පැල සොයාගැනීම, ඔසු සැකසීම, විස නැසීම ආදී කටයුතු වලදීත් හන්දි වෙදකම, ගෙඩි වෙදකම, විෂ වෙදකම, ඇස් වෙදකම හා අනෙකුත් වෙදකම් වලදීත් පාරම්පරික දැනුම යොදාගනී.

### ආහාර තාක්ෂණය

ජෛව විවිධත්වයෙන් පොහොසත් අප රට ලොව ජෛව විවිධත්ව උච්චස්ථාන අතලොස්ස අතරට ද අයත්ය. ජෛව විවිධත්වයේ මහිමයෙන් දැකිය හැකි ඉහල කෘෂිකාර්මික ජෛව විවිධත්වයත් එය ආශ්‍රයෙන් ඇතිවූ ආහාර සුරක්ෂිතතාවත් ජීවයේ පැවැත්මට ඉතාමත් උපකාරි වේ. ආහාර සැකසීමේ දී හා ආහාර කල්තබා ගැනීමේදී යොදා ගැනෙන තාක්ෂණය ආහාර තාක්ෂණය ලෙස හඳුන්වන අතර එහිදී ද පාරම්පරික දැනුමට හිමිවන්නේ අද්විතීය ස්ථානයකි.

### අනාවැකි පළකිරීම

පරිසරයත් සමග බද්ධව ජීවත්වන ජාතියක් වශයෙන් අප පරිසරයේ වෙනස්වීම් කල්තබා හඳුනාගෙන එයට අනුකූලව කටයුතු කිරීමත් ස්වභාවික විපත් මගින් වන හානි අවම කර ගැනීමටත් කටයුතු කරන ලදී. මෙහිදී ද පාරම්පරික දැනුම යොදාගත් අතර ඒවා මේඝ පඨල ශාස්ත්‍රය, වැහි ලකුණු බැලීම ආදී නම් වලින් හඳුන්වන ලදී.

වලාකුළු වල පිහිටීම හා පැහැය, සත්ත්ව හා ශාක විශේෂයන්හි ව්‍යාප්තිය හා විශේෂ හැසිරීම් අනාවැකි පළකිරීමේ දී සුලභව යොදාගැනේ.

### වාරි තාක්ෂණය

ජලාශ පිහිටුවීමේදීත් සොරොව් හා වාන් දොරටු පිහිටුවීමේදීත් හා ඉතා අඩු බෑස්මක් සහිතව ජලමාර්ග සැකසීමේදීත් අප සතුවූ පාරම්පරික දැනුම ඉදිරියේ නවීන තාක්ෂණය විපිළිසර වූ අවස්ථා එමටය.

### ධීවර කර්මාන්තය

මත්ස්‍ය සම්පත තිරසාර අයුරින් නෙලාගැනීමට යොදාගත් පාරම්පරික දැනුම මගින් පරිසරයේ ජෛව ධාරිතාව නොඉක්මවමින් මානව අවශ්‍යතා ඉටුකර ගැනීමට අවධානය යොමුකර ඇත.

### ඉදිකිරීම් ක්ෂේත්‍රය

පාරම්පරික දැනුමට අනුව නිවාස හා වෙනත් ඉදිකිරීම් කටයුතු කෙරුණු අතර ඒ සඳහා සුදුසු ස්ථාන හා අමුද්‍රව්‍ය ආදිය ද සපයා ගැනිනි. මෙහිදි ජ්‍යොතිෂ්‍ය ද පාරම්පරික දැනුම සමග යොදාගන්නා ලදී.

### වනාන්තර භාවිතය

මෙහිදීද පරිසරයේ ජෛව ධාරිතාව නොඉක්මවමින් පරිසරය භාවිතා කිරීම සිදුවූ අතර පාරම්පරික දැනුම අනුසාරයෙන් වනාන්තර හා එහි සම්පත් තිරසාරව පවත්වාගැනීමත් සිදුවිය. මෙහිදී පාරම්පරික දැනුම සමග සමාජ සාරධර්ම, ඇදහිලි විශ්වාස, වත් පිළිවෙත් ආදිය ද සම්බන්ධව ඇත.